අංක 15
2013 කලාපය

# සමාජ විමසුම

සමාජවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**සුසන්ත රස්නායක**

බී.ඒ.(පේරාදෙණිය)
එම්.ඒ. (පේරාදෙණිය)
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අංශයේ කථිකාචාර්ය

**ප්‍රදීප් උළුවඩුගේ**

බී.ඒ.(පේරාදෙණිය) එම්.ඒ. (පේරාදෙණිය)
එම්.ඒ. (එන්.එස්.යූ. බංගලාදේශය)
සබරගමුව ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ දේශපාලනවිද්‍යා අංශයේ කථිකාචාර්ය

**එච්.එම්.ඩබ්.ඒ.හේරත්**

බී.ඒ.(පේරාදෙණිය) එම්.පිල්. (පේරාදෙණිය)
එම්.එස්.සී.(ඒ.යූ.එන්. නෝර්වේ)
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථිකවිද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**භාග්‍යා කුලසේකර**

බී.ඒ.(පේරාදෙණිය)
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අංශයේ සහාය කථිකාචාර්ය

**මොහොමඩ් මහීස්**

බී.ඒ.(පේරාදෙණිය) එම්.ඒ. (කොළඹ)
පී.එච්.ඩී.(පී.ජී.අයි.ඒ. පේරාදෙණිය)
කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

## පටුන


සතිපොළවල් බහුලවීම හා සමාජීය පසුබිම
**අමරසිරි ද සිල්වා**

සංවර්ධනයේ අසරණයෝ: නව ජනාවාසකරණය ආශ්‍රිත මෙෙ
විසඳී නොමැති ගැටලු පිළිබඳ ව්‍යවහාරික සමාජවිද්‍යාත්මක වි
**කරුණාතිස්ස අතුකෝරළ**

එතෙර ගෘහ සේවය මෙතෙර ගෘහ පාලනය:
ශ්‍රී ලංකාවෙන් මැදපෙරදිගට සංක්‍රමණය වන කාන්තා
ගෘහ සේවිකාවන් ආශ්‍රයෙන්
**මල්ලිකා පින්නවල**

පාරිසරිකවාදය, තුන්වන ලෝකයේ පාරිසරික ව්‍යාපාර
හා ලාංකේය සමාජයේ අත්දැකීම්
**මොහමඩ් මහීස්**

පුද්ගල (ළමා) සංවර්ධනය පිළිබඳව කෙන් විල්බර් ( Ken Wilber
ඉදිරිපත් කළ අදහස් පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක්
**කුමාරි තෝරදෙණිය**

ව්‍යාපෘති ප්‍රේරිත ප්‍රතිලාභ-පිරිවැය මත විමසුමක්
(ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ව්‍යාපෘති ඇසුරින්)
**එච්.එම්.ඩබ්ලිව් ආරියරත්න හේරත්**

සමාජ හුවමාරු න්‍යාය පිළිබඳ හැඳින්වීමක්
**සුසන්ත රස්නායක**

ව්‍යසන කළමනාකරණය උදෙසා රාජ්‍ය නොවන සංවිධානයන්ගේ
භූමිකාව : දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පශ්චාත් සුඃ
ව්‍යසන කළමනාකරණ ක්‍රියාවලිය ආශ්‍රයෙන් සිදුකළ අධ්‍යයනයක්
**ප්‍රදීප් උළුවඩුගේ සහ තුෂාර කමල්රත්න**

දකුණු ආසියාවේ ළමා මන්දපෝෂණ තත්ත්වය
(ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්)
**භාග්‍යා කුලසේකර**

ග්‍රන්ථ විචාර
**සමාජවිද්‍යාව - 1 විෂය පථය සහ මූලික සංකල්ප**
**කර්තෘ: මහාචාර්ය අමරසිරි ද සිල්වා. කර්තෘ ප්‍රකාශනයකි**
**දයා අමරසේකර**

# පාරිසරිකවාදය, තුන්වන ලෝකයේ පාරිසරික ව්‍යාපාර හා ලාංකේය සමාජයේ අත්දැකීම්

මොහමඩ් මහීස්

## හැඳින්වීම

වර්තමානයේ පරිසරය පිළිබඳ කතිකාව තුන්වන ලෝකයේ සමාජ ආර්ථික මෙන්ම දේශපාලන ක්‍රියාවල ප්‍රධාන සාධකයක් බවට පත්ව ඇත. විශේෂයෙන් ම දියුණුවෙමින් පවතින රටවල ආර්ථික සංවර්ධනය මෙන් ම දේශපාලන බල තුලනයෙනි පාරිසරික ව්‍යාපාර (Environmental Movements) තීරණාත්මක සාධකයක් වෙමින් පවති. සීඝ්‍රයෙන් සිදුවන සංවර්ධන ක්‍රියාදාම හේතු කොටගෙන පාරිසරික වශයෙන් සිදුවන අයිතිවාසිකම් පිළිබඳ ගැටලු හඳුනාගැනීමටත්, ජාතික හා බිම් මට්ටමින් ජනතාවගේ පාරිසරික ප්‍රජාතන්ත්‍රවාදය (Ecological Democracy) වෙනුවෙන් පෙනී සිටීමටත් පාරිසරික ව්‍යාපාර ඉදිරිපත්වෙමින් සිටී. පාරිසරික සෞඛ්‍ය ගැටලු (Environmental Health Problems) වැඩි වශයෙන් සිදුවෙමින් පවතින වර්තමාන යුගයේ ඒවා පිළිබඳ ජනතාව දැනුවත් කිරීමටත් පරිසර සෞඛ්‍ය ගැටලු අවම වන පරිදි රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමටත් රජයට බල කිරීමට පාරිසරික ව්‍යාපාර කටයුතු කරමින් සිටි. එම නිසා පාරිසරික ව්‍යාපාර තුන්වන ලෝකයේ සිවිල් සමාජය වඩාත් ශක්තිමත් කොට දේශපාලන ආර්ථික ක්‍රියාදාමයේ න්‍යාය පත්‍රයේ වෙනස්කම් ඇති කොට රටක තිරසාර සංවර්ධනය ඇති කිරීමටත් ක්‍රියාකරමින් සිටී.

ශ්‍රී ලංකාව තුළ මහා පරිමාණයේ ජාතික මට්ටමේ පාරිසරික ව්‍යාපාර ඇති නොවුණත් නොයෙක් පරිසර ගැටලු මුල්කොටගත් බිම් මට්ටමේ (Grassroots) පාරිසරික ව්‍යාපාර ඇති වී ඇත. එප්පාවල පොස්පේට් නිධිය පෞද්ගලීකරණයට විරුද්ධ වූ ජන ව්‍යාපාරය, නොරොච්චෝලේ ගල් අඟුරු හා ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරවලට එරෙහි වූ මහජන ව්‍යාපාර හා අධිවේගී මාර්ගවලට විරුද්ධ වූ ජන අරගල ලාංකේය සමාජයේ ඇති වූ සාමූහික පාරිසරික ක්‍රියා (Collective Environmental Actions) හෝ පාරිසරික ව්‍යාපාරවලට කදිම නිදසුන් වේ.

ලාංකේය පරිසර ව්‍යාපාර තුන්වෙනි ලෝකයේ අනෙකුත් රටවල්වල පාරිසරික ව්‍යාපාරවලට වඩා වෙනස් මුහුණුවරක් ගනී. ලාංකීය පාරිසරික ව්‍යාපාර කෝලාහල චර්යාව (Crowd Behavior) හා නව





සමාජ ව්‍යාපාර යන තත්ත්ව දෙක අතර සිදුවෙන දෙයක් ලෙස හැඳින්විය හැකිය. ලාංකේය පාරිසරික ව්‍යාපාර ජීවිත අවදානම් තත්ත්වය (Livelihood Vulnerability), ආගමික නායකත්වය, සංස්කෘතික අනන්‍යතාව හා බිම් මට්ටමේ තිබෙන බල සම්බන්ධතා යන සාධක මුල්කොටගෙන ඇතිවිය. ලාංකේය පරිසර ව්‍යාපාරයන්හි ගොවීන්ගේ හා ධීවරයින්ගේ ක්‍රියාකාරීත්වය ඉතා ප්‍රබල වන නමුත් අනෙකුත් තුන්වන ලෝකයේ රටවල මෙන් ම කාන්තාවන්ගේ දායකත්වය ඉතා සීමිත මට්ටමින් පවතී. මෙම ලිපිය නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට එරෙහිවූ මහජන ව්‍යාපාරය පිළිබඳ කෙරුණු පාරිසරික සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් පදනම් කොටගත් එකක් වේ.

## පාරිසරිකවාදය

පරිසරය පිළිබඳ සංකල්පය අදවන විට අතිශයින් තීරණාත්මක හා ජනප්‍රිය මාතෘකාවක් බවට පත්ව ඇත. වර්තමානයේ පරිසරය ස්වාභාවික විද්‍යාවට පමණක් සීමා නොවී සමාජීය විද්‍යා අතරද බෙහෙවින් ජනප්‍රිය වී ඇත. අද අප හමුවේ තිබෙන බොහොමයක් පරිසර ගැටලු අවබෝධ කර ගැනීමටත්, ඒවා විසඳීමටත් සමාජීය විද්‍යාවල කාර්යභාරය ඉතා වැදගත්ය (Sirisena 2010). එමනිසා පාරිසරික සමාජ විද්‍යාව (Environmental Sociology), දේශපාලන පරිසර විද්‍යාව (Political Ecology) හා සමාජීය භූගෝලීය විද්‍යාව (Social Geography) යන විෂය ක්ෂේත්‍ර වැදගත් විය. පරිසරය යනු ජීවි වස්තූන්ට ජීවත් වීමට අවශ්‍ය කරන සමස්ත තත්ත්වයක් වේ. මෙම තත්ත්වය ජීවින්ගේ හා අජීවි වස්තු අතර ඇතිවන අන්තර් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලවලින් ඇති වේ (Barrow 1995). ප්‍රකට පාරිසරික සමාජ විද්‍යාඥයෙකු වූ Dwivedi (2001) ට අනුව පරිසරය යනු සමාජීය වශයෙන් තරගකාරී ලෙස ගලන හා ස්ථිර නොවූ ලෙසත් තර්කානුකූලව විද්‍යාත්මක මතයේ සිට ආගමික මතවාදයක් දක්වා දිවයන සංකල්පයක් වේ (Mahees 2010). පරිසරය පිළිබඳව වර්තමාන කතිකා යම් තීරණාත්මක ක්ෂේත්‍රයක් පිළිබඳව අවධානයක් යොමු කරයි. වායුගෝලයේ ගුණාත්මකභාවය, ජලයේ පැවැත්ම, පසේ සරු බව අහිමිවීම, ජාන විවිධත්වය විනාශවීම, ස්වාභාවික ආහාර විෂවීම, අන්තරායක කසල බැහැර කිරීම හා ස්වාභාවික සම්පත් විනාශ වී යෑම යන ගැටලු පිළිබඳව ඇතිවී තිබෙන මතවාද පරිසරය මතවාදය අලුත් මුහුණුවරකට යොමු කරමින් තිබේ. පාරිසරිකවාදය යන සංකල්පය නොයෙක් කතිකා හා මතවාද යටතේ සාකච්ඡා කරනු ලැබේ. පාරිසරික වාදය, පාරිසරික ව්‍යාපාර ගැඹුරු පරිසර විද්‍යාව (Deep Ecology) පාරිසරික ස්ත්‍රීවාදය (Eco-Feminism) හා හරිත දේශපාලනය (Green Politics) යන මාතෘකා සමග සාකච්ඡා කරනු ලැබේ.

පාරිසරිකවාදය එක්තරා ආකාරයක ජීවන රටාවක්, මානසික තත්ත්වයක්, සමාජය පිළිබඳ ආකල්පයක් හෝ දේශපාලන දර්ශනයක් විය හැකිය. සමහර විට පාරිසරිකවාදය පාරිසරික ව්‍යාපාර හෝ සංරක්ෂණ ව්‍යාපාර (Conservation Movement) ලෙසින් ද හැඳින්වේ (McCormic 1992). එම නිසා පාරිසරිකවාදය පාරිසරික විද්‍යාවක් ද?, එය දර්ශනයක් ද? නැත්නම් දේශපාලන මතවාදයක් ද? එසේ නැත්නම් මේ සියල්ල ද? මෙය අප විසින් සාකච්ඡා කළ යුතු හා තවදුරටත් අධ්‍යයනය කළ යුතු වේ. පාරිසරිකවාදය හා පාරිසරික ව්‍යාපාර එක ම කාසියක දෙපැත්තක් මෙන් කටුයතු කරයි. පාරිසරිකවාදය තුළ සංකල්ප අදහස් මතවාද ලෙසින් තිබෙන දේ ප්‍රායෝගික ලෙස ක්‍රියාවට නංවන්නේ පාරිසරික ව්‍යාපාර මගින් ය. එමෙන්ම පාරිසරික ව්‍යාපාර මගින් පාරිසරිකවාදය නිරන්තරයෙන් ම ප්‍රතිපෝෂණය කරනු ලබන අතර එම පාරිසරිකවාද නැවතත් සාමූහික ක්‍රියා ලෙස සමාජයට මුදවා හරිනු ලැබේ.

බටහිර පාරිසරික ආකල්පවලට අනුව පාරිසරිකවාදය වික්ටෝරියානු සංස්කෘතියේ සොබා දහමට ආදරය කළ අයගෙන්, එකල ජීවත් වූ ධානපතීන්ගෙන් හා වෘත්තීයවේදීන්ගේ මැදිහත් වීමෙන් ඇතිවූ බවට විශ්වාස කරනු ලැබේ. එමෙන් ම පාරිසරිකවාදය ඇතිවීමට නොයෙක් ආගමික හා දේශපාලනික මතවාද හේතු සාධක විය. පාරිසරිකවාදය ඇතිවීමට පරිසරය පිළිබඳ කතිකාව බෙහෙවින් බලපෑම් සිදුකර ඇතැයි Hannigan (2006) අදහස් කළේය. ඔහුට අනුව ගැමි පරිසර සුන්දරත්වය (Arcadin) පරිසර යුක්තිය (Environmental Justice) හා පරිසරය පිළිබඳ දැනුම (Knowledge of Eco-system) යන සාධක පාරිසරිකවාදය ඕනෑම සමාජයක ඇතිවීමට හේතු වන්නේ ය. මීට අමතරව ප්‍රකට පරිසර විද්‍යාඥයකු වූ Ulrich Beck තම Risk Society (1992) කෘතියේ සඳහන් කරන්නේ වර්තමානයේ අප ජීවත්වන සමාජයේ නොයෙක් ආකාරයේ අවදානම් හා අනතුරු (Risk) තත්ත්වයන්ගෙන් පිරී බවතින බවයි. එවන් ආකාරයෙන් පාරිසරික වශයෙන් ඇති වී තිබෙන හෝ ඇතිවීමට නියමිත අවදානම් තත්ත්ව වර්තමාන ලෝකයේ පාරිසරික වාදය පිළිබඳ කතිකාව නව මුහුණුවරකට යොමු කරමින් තිබේ. අදවන විට අප අහමුවේ අභියෝග ලෙස ගොඩ නැගී ඇති නොයෙක් කාලගුණ විපර්යාස හා පාරිසරික සෞඛ්‍ය ගැටලු පාරිසරිකවාදය නව දේශපාලන ආර්ථික මතවාදවලින් ප්‍රතිපෝෂණය කරමින් තිබේ.

පාරිසරිකවාදය මගින් මහජනතාවගේ පරිසරය පිළිබඳ ආකල්ප වෙනස් කිරීමට නිරන්තරයෙන් උත්සාහ කරමින් සිටි. පාරිසරික වශයෙන් නොයෙක් බලපෑම්වලට ලක්වන වර්තමාන ලෝකයේ





පාරිසරිකවාද දේශපාලන සංස්කෘතික ආගම්, පන්ති, කුල, ජාති යන සීමා අභිභවා ගොස් ජනතාවගේ පාරිසරික විඥ්ඥාණය ඉහළ දැමීමට කටයුතු කරමින් තිබේ. නිදසුනක් ලෙස කාළගුණ විපර්යාස හෝ එමගින් සිදුවන හානි පිළිබඳ දැනුවත් කිරීමටත් ඒවා ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර සංවිධාන කරා ගෙන යාමට පාරිසරිකවාදය ප්‍රබල විය. එම නිසා අපි පාරිසරිකවාදය මගින් හසුරුවන දේශපාලන ක්‍රමයකට ළඟාවෙමින් සිටින යුගයක් කරා ගමන් කරමින් සිටිමු.

පාරිසරිකවාදය අධ්‍යයනය කිරීමේ දී ගැඹුරු පරිසර විද්‍යාව හා සමාජ පරිසර විද්‍යාව යන මතවාද ඉතා වැදගත් වේ. ගැඹුරු පරිසර විද්‍යාවේ පාරිසරිකවාදය හා පාරිසරික ව්‍යාපාරය යන දෙක ම යම් අනුකලනයකට ලක් කරන ලද මතවාදයක් ලෙස ඉදිරිපත් කොට ඇත. ගැඹුරු පරිසර විද්‍යාඥයින්ට අනුව මානව ජීවිතය නොයෙක් කෘත්‍රිම භෞතික අවශ්‍යතාවන්ගෙන් පිරී තිබෙන අතර මෙම අවශ්‍යතාවන් ස්වාභාවික සම්පත් හා පරිසර පද්ධතිය විනාශ කරමින් තිබේ. ඔවුන්ගේ අදහස්වලට අනුව සොබාදහම සහ මානුෂික බව (Humanity) වෙනස් කරුණු දෙකක් නොවේ. මිනිසා හෝ මානුෂික බව සොබාදහමේ ම කොටස් වේ. මිනිසාගේ භෞතික සුඛ විහරණය සඳහා සොබාදහම තමන්ට අවශ්‍ය සේ භුක්තිවිඳින හා පාලනය කරන මානව කේන්ද්‍රවාදය (Anthropocentricism) ගැඹුරු පරිසර විද්‍යාඥයන් විසින් ප්‍රතික්ෂේප කෙරෙයි (Pepper 1996).

Anne Naess නම් චින්තකයාට අනුව ගැඹුරු පරිසර විද්‍යාව හා පාරිසරිකවාදය හුදෙක් පරිසර විද්‍යාවන්වලින් පමණක් ඇතිවන එකක් නොවේ. එය වැඩි වශයෙන් සමාජය සමඟ ඒකාබද්ධව කටයුතු කරනු ලබයි. ගැඹුරු පරිසර විද්‍යාව නිරන්තරයෙන් ම පෙරදිග සමාජය හා ඒවායෙහි ආගමික මතවාද පරිසරික වාදයට රැගෙන යමින් සිටී. ගැඹුරු පරිසර විද්‍යාව මගින් ලෝ පුරා සිටින සියලු ජාතීන්ගේ ආගමික විශ්වාස සංස්කෘතික ක්‍රියාකාරකම් පොදු සාමූහික පාරිසරික ආචාර ධර්ම පද්ධතියක් ඇති කිරීමට උත්සාහ දරයි. මෙමගින් නොදියුණු බිම් මට්ටමින් සිටින ප්‍රජාවන්ගේ පරිසරය පිළිබඳ විශ්වාස හා ක්‍රියාකාරකම් සැලකිල්ලට ගනු ලබයි (Pepper 1996). මෙම මතවාදයෙන් පෙන්නුම් කරන්නේ පාරිසරිකවාදය හෝ පාරිසරික ව්‍යාපාර ඇතිවීමට හා ඒවා පවත්වාගෙන යෑමට භෞතික වශයෙන් නොදියුණු හෝ විද්‍යාත්මක තාක්ෂණයෙන් ඈත්ව සිටින බිම් මට්ටමේ ජනතාවගේ පරිසරය පිළිබඳ ආකල්ප, දැනුම හා සාමූහික ක්‍රියාකාරකම් බෙහෙවින් වැදගත්වන බවයි. වර්තමානයේ බොහෝ තුන්වන ලෝකයේ පරිසර ව්‍යාපාර බිම් මට්ටමේ ප්‍රාථමික ජන කොටස් තුළින් ඇතිවීම මෙයට කදිම උදාහරණයක් වේ.

සමාජ පරිසර විද්‍යාව බොහෝ දුරට පාරිසරික සමාජවාදය (Eco-socialism) සමග ඉතා සමීපව කටයුතු කරයි. මෙම මතවාදයන් දෙක ම දෙයාකාරයකින් ගැඹුරු පරිසර විද්‍යාව විවේචනය කරයි. සමාජ පරිසර විද්‍යාව ආධිපත්‍ය හා පුරුෂාධිපත්‍ය තිබෙන බල ධුරාවලිය මුල්කොටගෙන පාරිසරිකවාදය පිළිබඳ මතවාද ඉදිරිපත් කරන්නේය. සමාජ පරිසරවාදීන් පවසා සිටින්නේ පුරුෂාධිපත්‍ය හා ධනවාදී රාජ්‍යන්හි ආධිපත්‍ය අහෝසි කිරීම මගින් සමාජයට හා පරිසරයට යහපතක් සිදුවන බවයි. මෙම මතවාදයේ පාරිසරික ස්ත්‍රීවාදයට බොහෝ දුරට සමාන වේ (Pepper 1996).

පාරිසරික කාන්තාවාදය ස්ත්‍රීවාදීන්ගේ මෙන් ම පරිසරවේදීන් අතර දෝලනය වෙන සංකල්පයක් බවට පත්ව ඇත. Agarwal ට (1997) අනුව පාරිසරික කාන්තාවාදී තර්ක කරුණු හතරක් මුල්කොටගෙන ක්‍රියාත්මක වේ.

1. කාන්තාවන් මර්දනය කිරීම හා සොබාදහම සූරාකෑම අතර සම්බන්ධතාවයක් පවතී.
2. කාන්තාවන් සොබාදහමට සමීපව ද, පුරුෂයන් සංස්කෘතියට සමීපව සිටින බවට සැලකෙයි. එම නිසා සොබාදහම යටත්ව සිටින මෙන් කාන්තාවද පුරුෂයින්ට යටත්ව සිටී යැයි සලකනු ලබයි.
3. සොබාදහම මෙන්ම කාන්තාව ද පුරුෂයින් විසින් යටත් කරගෙන ඇත.
4. ස්ත්‍රීවාදී ව්‍යාපාර හා පරිසර ව්‍යාපාර මානව හා පාරිසරික අධ්‍යයනයන් වෙනුවෙන් කටයුතු කරන මතවාදයක් සහ ක්‍රියාවක් වේ.

Mies සහ Shiva (1993) සඳහන් කරන ආකාරයට දැනට ලෝකයේ පවතින ධනවාදී පුරුෂාධිපත්‍ය අර්ථක්‍රමය පරිසරයට පමණක් නොව මුළු මිනිස් සමාජයට ම තර්ජනයක් බවට පත්ව ඇත. එම විනාශය නිසා වඩාත් පීඩාවට පත්වන්නේ කාන්තාවන් හා දරුවන් මෙන්ම සමාජ විෂමතාවට ලක්වූ පිරිමින් ය. එම නිසා පාරිසරික කාන්තාවාදීන් වර්තමාන පරිසර සංහාරයට එරෙහිව සටන් කරමින් සිටින අතර එය හුදෙක් ම ස්ත්‍රීවාදී සටනක් නොව පරිසර සංරක්ෂණය සඳහා වූ අරගලයකි. මේ හේතුවෙන් පාරිසරික ස්ත්‍රීවාදය පාරිසරිකවාදයටත් පාරිසරික ව්‍යාපාරවලටත් ප්‍රධාන පසුබිමක් සපයන්නේ ය. අදවන විට ලොව පුරා දක්නට ලැබෙන බොහෝ පාරිසරික ව්‍යාපාරවල කාන්තාවන් ප්‍රමුඛ ලෙස කටයුතු කිරීම මෙයට කදිම ලෙස සාක්ෂ්‍ය දරයි.





පරිසර පිළිබඳ මතවාද සම්භාව්‍ය සමාජ විද්‍යාව හා නව සමාජ විද්‍යාත්මක න්‍යාය තුළ තරමක් අඩුවෙන් ගොඩනැගී තිබුණ ඒවා වැඩි වශයෙන් පශ්චාත් නූතනවාදී සමාජ විද්‍යා පර්යාලෝකයන්හි සාකච්ඡා කරනු ලැබේ. මූලික වශයෙන් සමාජ විද්‍යාවෙහි පශ්චාත් නූතනවාදයට විවේචන ඉදිරිපත් වුවද පාරිසරිකවාදය සම්බන්ධයෙන් පශ්චාත් නූතනවාදීන්ගේ දායකත්වය ඉතා වැදගත් වේ. පරිසරය පිළිබඳ පශ්චාත් නූතන මතවාදය බොහෝ දුරට ගැඹුරු පරිසර විද්‍යාවේ දී සාකච්ඡා කරනු ලැබේ. Gare (1995) තම The Post-modernism and Environmental Crisis යන ග්‍රන්ථයේ සඳහන් කරන ආකාරයට පාරිසරික වාදය පිළිබඳ පශ්චාත් නූතනවාදී තර්ක ඇති වීමට Heidegger ගේ නූතන යුගය පිළිබඳ ඉදිරිපත් කරන ලද ශූන්‍යවාදී මූල (Root s of Nihilism) ඉතා වැදගත් විය.

පශ්චාත් නූතනවාදී පරිසරවාදයට ප්‍රධාන දායකත්වයක් සිදු කරන ලද්දේ Michael Foucault විසිනි. Foucault ගේ පරිසරවාදය බල සම්බන්ධතාව මුල්කොටගෙන කතිකා සංස්කරණයෙන් ඉදිරිපත් කරන ලද්දේය. ඔහුගේ පාරිසරිකවාදයෙහි ජෛව දේශපාලනය (Bio-politics) යන සංකල්පයෙන් බලය හා පරිසර දැනුම අතර ඒ සම්බන්ධතාව ද, පරිසර දැනුම උත්පාදනය හා එය ක්‍රියාවට නංවන ආකාරය ද අවබෝධකර ගත හැකිවේ (Mahees 2010). ඒ අනුව පාරිසරික දැනුම හෝ පාරිසරිකවාදය සකස් කිරීමට, එය පවත්වාගෙන යෑමටත් දේශපාලන බලය මගින් ඉදිරිපත් කරන කතිකා ඉතා වැදගත් වේ. Foucault ගේ අදහස්වලට අනුව වර්තමාන ලෝකයේ සමාජ පර්යාය හෝ දේශපාලන බල සම්බන්ධතාව සොබාදහම පාලනය කරමින් සිටින අතර බොහෝ පාරිසරික අර්බුද දේශපාලන බල ව්‍යුහය තුළ සිරවී ඇත (Darier 1999).

Fouchaultට අනුව පරිසර ගැටලු හා පාරිසරික ක්‍රියාකාරකම් අවබෝධ කර ගැනීමට ජනතාවගේ දැනුම ඉතා වැදගත් ය. තුන්වන ලෝකයේ සිදුවන පාරිසරික විපර්යාස අධ්‍යයනය කිරීම සඳහා ග්‍රාමීය ප්‍රජාවගේ ස්වදේශීය දැනුම (Indegeneous Knowledge) බෙහෙවින් තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරයි. පශ්චාත් නූතනවාදී පාරිසරිකවාදයට එක්කරගත හැකි තවත් තර්කයක් Habamas ඉදිරිපත් කරයි. ඔහුට අනුව සංස්කෘතිය හා වෙනස් වන පාරිභෝගික රටා පාරිසරික ගැටලු ඇතිකරන අතර එම නිසා පාරිසරික උද්ඝෝෂණ ඇතිවන්නේ ය. Habamas තවදුරටත් පෙන්වා දෙන්නේ ප්‍රතිසංස්කරණය කරන ලද සංස්කෘතිය සමාජ ජීවිතයට එල්ල කරන පීඩනය පරිසර ගැටලු වැඩි වශයෙන් ඇති කරන අතර එම නිසා ජනතාව එම පීඩනයෙන් ගැලවීම පිණිස පාරිසරිකවාදය ප්‍රමුඛ කරගත් පාරිසරික ක්‍රියාකාරකම්වල නිරත වන බවයි (Gare 1995).

## තුන්වන ලෝකයේ පාරිසරික ව්‍යාපාර

පාරිසරික ව්‍යාපාර සමාජ ව්‍යාපාර, මුල්කොටගෙන අධ්‍යයනය කරයි. එම නිසා පරිසර ව්‍යාපාර හොඳින් අවබෝධ කර ගැනීමට පැරණි හා නව සමාජ ව්‍යාපාර පිළිබඳව අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ. සමාජ ව්‍යාපාරයක් යනු සමාජ ජීවිතයෙහි සමාජ යුක්තිය සමාන ලෙස ලබා ගැනීම සඳහා සාමූහික වශයෙන් ජනතාව විසින් සිදු කරන ඉල්ලීම් හා ක්‍රියා වේ (Giddens 1989). මෙම සාමූහික ක්‍රියා මගින් ජනතාව තම දේශපාලන සංස්කෘතික හා ආර්ථික උරුම ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කිරීම මෙහි දී වැදගත් වේ.

සමාජ ව්‍යාපාර මූලික වශයෙන් සම්භාව්‍ය හෝ නව සම්භාව්‍ය (Classical or Neo-classical) සම්ප්‍රදාය මගින් කෝලහාල චර්යාව (Crowd behaviour) පදනම් කොටගෙන අධ්‍යයනය කෙරේ. මේ හේතුවෙන් තුන්වන ලෝකයේ බොහෝ පරිසර ව්‍යාපාර හෝ සාමූහික පරිසර ක්‍රියා අවබෝධ කර ගැනීමට කෝලහාල චාර්යාව පිළිබඳ න්‍යාය යොදාගනු ලැබේ (Mahees 2010). නමුත් සියලු ආකාරයේ පාරිසරික ක්‍රියා කෝලාහල චර්යා න්‍යාය මගින් අවබෝධකර ගැනීමට නොහැකි වූ බැවින් නව සමාජ ව්‍යාපාර න්‍යාය යොදාගනු ලැබුවේය. Faulksට (2001) අනුව නව සමාජ ව්‍යාපාර පැරණි සමාජ ව්‍යාපාරවලට වඩා බෙහෙවින් වෙනස් වන්නේය. නව සමාජ ව්‍යාපාරයක් බිම් මට්ටමේ පන්ති සටන් අභිබවා ගිය හුදෙක් භෞතිකවාදී නොවී දේශපාලන පක්ෂ පදනමකින් තොරව ජීවිකා ගැටලු මුල්කොටගත් ජන ව්‍යාපාරයක් වේ. තුන්වන ලෝකයේ දක්නට ලැබෙන බොහෝ පාරිසරික ජන ක්‍රියා වන්හි නව සමාජ ව්‍යාපාර ලක්ෂණ දැකිය හැකිය. එම නිසා පරිසර ව්‍යාපාර සමාජ ව්‍යාපාරයක් හෝ එහි කොටසක් ලෙස හඳුන්වා දීම ප්‍රකට කරුණක් වේ. ඉන්දියාවේ නර්මදා හා කෙන්යානු ග්‍රීන්ඩ් බෙල්ට් යන ප්‍රකට පාරිසරික ව්‍යාපාර වැඩි වශයෙන් නව සමාජ ව්‍යාපාර ගණයට අයත්වන ලක්ෂණ තිබීම මෙයට කදිම නිදසුනක් වේ. පරිසර ව්‍යාපාරවලට අමතරව ස්ත්‍රීවාදී ව්‍යාපාර, මානව හිමිකම් ව්‍යාපාර හා න්‍යෂ්ටික වැඩසටහන්වලට එරෙහි වූ ව්‍යාපාර නව සමාජ ව්‍යාපාරවලට අයත් වේ.

1970 අග භාගයේ දී යුරෝපයේ ඇති වූ පශ්චාත් කාර්මික සමාජ ගැටලු මුල්කොටගෙන පාරිසරික ව්‍යාපාර ඇති විය. නමුත් යුරෝපය ඇතුළු බටහිර සමාජයේ ඇති වූ පාරිසරික ව්‍යාපරවලට වඩා බෙහෙවින් වෙනස් පාරිසරික ව්‍යාපාර දියුණු වෙමින් පවතින රටවල ඇති විය. Mahees ට (2010) අනුව නූතන පාරිසරිකවාදය ප්‍රධාන වශයෙන් කොටස් 03 කට බෙදා වෙන් කළ හැකිය.





01. සෞන්දර්යාත්මක පාරිසරිකවාදය (Easthetic Environmentalism)
02. මතවාදාත්මක පාරිසරිකවාදය (Ideological Environmentalism)
03. ජීවිකාව මුල්කොටගත් පාරිසරිකවාදය (Livelihood Environmentalism)

පරිසරය පිළිබඳ සෞන්දර්යාත්මක ආකල්පයෙන් ගොඩනැගෙන පාරිසරිකවාදය හෝ එම නිසා ඇතිවන සාමූහික ක්‍රියාවන් පළමු කොටසට අයත් වේ. මෙය මධ්‍යම පන්තික ජනතාව අතර වැඩි වශයෙන් දැක ගත හැකි වේ. දෙවනුව පරිසරය පිළිබඳ දැනුම හෝ මතවාදය මගින් දාර්ශනික හෝ විද්‍යාත්මක ලෙස ගොඩනැගෙන පාරිසරිකවාදයයි. මෙහි දී ආගම දේශපාලනය, සාමානතාව මෙන්ම විද්‍යාත්මක මූලධර්ම මුල්කොටගෙන පරිසර සංරක්ෂණයට අදාළ ජීවන රටාවක් හා මතවාදයක් ගොඩ නැගෙන්නේය. මෙය විශේෂයෙන්ම ආකල්ප හා පරිභෝජන රටාවෙන් පරිසර මතවාදයට බලපෑම් කරන්නේය. Mahees (2010) සඳහන් කරන ආකාරයට තුන්වන ලෝකයේ බොහෝමයක් පාරිසරික ව්‍යාපාර ජීවිකාව මුල්කොටගත් පාරිසරිකවාදයෙන් ආරම්භ වන්නේය. පාරිසරික සුන්දරත්වය හෝ මතවාදය සැලකිල්ලට නොගෙන පාරිසරික පද්ධතියෙන් නිර්මාණය වී ඇති ජීවිකාව පදනම් කොටගෙන බිම් මට්ටමේ අවදානම් කණ්ඩායම් තම ජීවිකාව ආරක්ෂා කර ගැනීම සඳහා පරිසර පද්ධතිය වෙනුවෙන් කටයුතු කිරීම ජීවිකාව මුල්කරගත් පාරිසරිකවාදය ලෙස හඳුන්වාදිය හැකිය. ලාංකික සමාජයෙහි නිරන්තරයෙන් ඇති වන පාරිසරික ක්‍රියා මෙම ගණයට අයත් වේ.

පරිසර ව්‍යාපාර පිළිබඳ නිවැරැදි නිර්වචනයක් ලබාදීම දුෂ්කර කාර්යයක් වුවත් Dwivedi (2001) පරිසර ව්‍යපාර පිළිබඳව ඉතා සරල නිර්වචනයක් ඉදිරිපත් කළේය. පරිසර ව්‍යාපාරයක් යනු සමාජීය ලෙස හා තර්කානුකූල ලෙසත් සකස් වන්නා වූ මතවාදයන් හා ක්‍රියාවන්, න්‍යායයන් හා ක්‍රියාකාරකම් ය. මෙම නිර්වචනය දියුණු ලෝකයේ මෙන් ම දියුණුවෙමින් පවතින තුන්වන ලෝකයේ පරිසර ක්‍රියාකාරකම් සැලකිල්ලට ගෙන සකස් කොට ඇත. මෙම නිර්වචනයට අනුව යම් සමාජයක පරිසරය හෝ පරිසරයට වක්‍රව ඇතිවන හෝ ඇතිවීමට නියමිත අවදානම් තත්ත්වවලට අදාළ වන සමාජය විසින් සංස්කරණ කරනු ලබන වාද විෂයන් (Issues) මුල්කොටගෙන පරිසර ව්‍යාපාර නිර්මාණය විය හැකිය. යෝජිත ජල හෝ අධිවේගී මාර්ග ව්‍යාපෘති හේතුකොටගෙන අනාගතයේ පරිසරයට හා සමාජයට එල්ලවන අභියෝග මුල්කොටගත් බිම් මට්ටමේ පරිසර ව්‍යාපාර මෙයට කදිම නිදසුනක් වේ.

Dwivedi (2001) ප්‍රධාන වශයෙන් පාරිසරික ව්‍යාපාරයෙන් කොටස් දෙකකට වෙන්කොට හඳුනා ගත්තේය. එයට අනුව,

1. නව සමාජ ව්‍යාපාරවල බලපෑම් සහිත දියුණු රටවල ඇතිවන පරිසර ව්‍යාපාර
2. ජීවිකා සහායක පරිසර පද්ධතිය (Life Supporting Ecological System) මුල්කොට ගත් දියුණු වෙමින් පවතින සමාජ වල ඇතිවන පරිසර ව්‍යාපාර

පළමුවෙනි වර්ගයට අයත් පරිසර ව්‍යාපාර දියුණු වූ බටහිර සමාජයේ පශ්චාත් භෞතිකවාදී ප්‍රතිපත්ති මුල්කොටගෙන ඇතිවන්නේ ය. මෙය බොහෝ දුරට පෙර සඳහන් කළ මතවාදාත්මක පරිසරවාදයෙන් ඇතිවන අතර ඒවා පන්ති විෂමතාවන් මෙන්ම පුද්ගල සංස්කෘතික අගයන් අභිභවා ගිය පොදු සටනක් බවට පත්ව ඇත. මෙවන් ව්‍යාපාරයන්හි වැඩි වශයෙන් උගත් මධ්‍යම පන්තිකයෝ දක්නට ලැබෙති. මෙම ගණයට අයත් පරිසර ව්‍යාපාර සිවිල් සමාජය, මාධ්‍යය හා නීතිමය ආධාර මුල්කොටගෙන තම සමාජ ව්‍යාපාරය පවත්වාගෙන යයි. සත්ව අයිතිවාසිකම්, පාරිසරික සෞඛ්‍ය හා පාරිසරික වශයෙන් වැදගත් දේශපාලන තීරණ මෙවන් පරිසර ව්‍යාපාරවල ප්‍රධාන පසුබිම බවට පත්වේ. දියුණු ප්‍රථම ලෝකයේ ක්‍රියාත්මක වන මෙවන් පරිසර ව්‍යාපාර හෝ ඒවායෙහි නොයෙක් කොටස් දියුණුවෙමින් පවතින සමාජවල සිටින මධ්‍යම පාන්තික ජන කොටස් අතර ද දැකගත හැකි වේ.

දෙවෙනි වර්ගයට අයත් පරිසර ව්‍යාපාර වැඩි වශයෙන් දියුණුවෙමින් පවතින රටවල දැකගත හැකි වේ. මෙම පරිසර ව්‍යාපාර තරගකාරී හෝ සට්ටනවාදි කොටස් දෙක අතර ඇතිවන ගැටුම්වල ප්‍රතිඵලයක් නිසා ඇති වේ. විශේෂයෙන් ම ගොවීන් හා ජනතාව රජය හෝ කාර්මාන්තකරුවන් සමඟ සංවර්ධන ක්‍රියාවන් මුල්කොටගෙන ඇතිවන සට්ටනවාදී තත්ත්වයන් හේතුවෙන් මෙම පරිසර ව්‍යාපාර ඇතිවේ. Vandana Shiva (1991) සඳහන් කරන අන්දමට මෙම තරගකාරී කොටස් දෙක පහත සඳහන් ආකාරයට වේ.

1. සංවර්ධන ක්‍රියාදාමයෙන් වරප්‍රසාද ලබන අය.
2. සංවර්ධන ක්‍රියාදාමයේ පිරිවැය දරන අය.

තුන්වන ලෝකයේ ඇතිවන පරිසර ව්‍යාපාර පිළිබඳ දීර්ඝකාලයක් තිස්සේ අදහස් දක්වන Shiva (1991) තවදුරටත් පවසා සිටින්නේ, ස්වාභාවික සම්පත් මුල්කොටගත් තුන්වන ලෝකයේ





සංවර්ධන ක්‍රියා ආර්ථික හා දේශපාලන වශයෙන් අසරණ ජන කොටස් ඉතා අවදානම් තත්ත්වයට පත්කොට ඇති බවයි. සංවර්ධනයෙන් පරිසර පද්ධතියට ඇතිවන බලපෑම් සෘජුව හා වක්‍රව එම පරිසර පද්ධතිය මුල්කොටගෙන ජීවත්වන ජනතාවගේ ප්‍රශ්නයක් බවට පත්ව ඇත.

එම නිසා දියුණුවෙමින් පවතින බොහෝ රටවල ජල ව්‍යපෘති,අධිවේගී මාර්ග, වාණිජ වන ව්‍යාපෘති බලශක්ති නිෂ්පාදනය කැණීම් හා නොයෙක් අධිතාක්ෂණික කෘෂිකාර්මික ක්‍රියා අද වන විට පරිසර ව්‍යාපාරවල සටන් බිමක් බවට පත්ව ඇත. තුන්වන ලෝකයේ සිදුවන මෙම පරිසර ව්‍යාපාරවල ප්‍රධාන ක්‍රියාකාරීන් බවට පත්වන්නෝ ගොවියන්, ධීවරයන්, කාන්තාවන් අඩු වරප්‍රසාදලාභී ජනකොටස් (ගෝත්‍රිකයන් හා කුලහීනයන්) හා බිම්මට්ටමේ සිවිල් ජන ක්‍රියාකාරිහුය. මොවුන්ට යම් ආකාරයක දේශපාලන, මාධ්‍යවල මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගය ලැබීමද දක්නට ලැබේ. මෙම සාමූහික පරිසර ක්‍රියාකාරකම් මාක්ස්වාදය, මාවෝවාදය මෙන් ම ගාන්ධිවාදය වැනි මතවාද හෝ ඔවුන්ගේ සටන් ක්‍රම යොදාගනිමින් තම පරිසර ව්‍යාපාරය සමාජයෙහි වඩාත් ජනප්‍රිය කරවීමට ද ක්‍රියාකරමින් සිටී. Dwivedi සඳහන් කරන ආකාරයට කෙන්යාවේ Green Belt, නයිජීරියාවේ Ogoni, බ්‍රසීලයේ Rubber Tappers, ඉන්දියාවේ Chipco මෙවන් පරිසර ව්‍යාපාරවලට කදිම නිදසුනක් වේ.

තුන්වන ලෝකයේ පරිසර ව්‍යාපාර පිළිබඳ සාකච්ඡා කරන විට ඉන්දියානු පාරිසරිකවාදය ඉතා සුවිශේෂ වන්නේ ය. ඉන්දියානු පාරිසරික ව්‍යාපාර හා ඒවා පිළිබඳ කෙරුණ පර්යේෂණ හා අධ්‍යයන තුන්වන ලෝකයේ පාරිසරික ව්‍යාපාර පිළිබඳ අලුත් න්‍යාය හා මතවාද ඉදිරිපත් කළේ ය. ඉන්දියානු පාරිසරික ව්‍යාපාර පිළිබඳව ශාස්ත්‍රීය අදහස් පළකරන බොහෝ දෙනා අතර Vandana Shiva හා Ramachandra Guha ශ්‍රී ලංකාවේ පාරිසරික වාදය පිළිබඳ පර්යේෂණ කටයුතුවලට බොහෝ බලපෑම් කළ නිසා ලාංකීය පාරිසරික ව්‍යාපාරය අධ්‍යයනය කිරීමට ඉන්දියානු පාරිසරිකවාදය ඉතාමත් වැදගත් වී ඇත.

ඉන්දියානු පාරිසරික ව්‍යාපාර මූලික වශයෙන් ප්‍රධාන තත්ත්වයන් තුනක් මත රඳා පවතින්නේ ය. ඒවා,

1. සාමූහිකව පාරිසරික ක්‍රියා සංවිධාන කිරීම.
2. පාරිසරිකවාදය පිළිබඳ අධ්‍යාපනය හා සන්නිවේදනය.
3. පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීම.

මීට අමතරව ඉන්දියානු සාමූහික පාරිසරික ව්‍යාපාරයන්හි සුවිශේෂ වූ ක්‍රියා 06ක් දක්නට ලැබුණේය (Guha & Gadgil 1994). ඒවා නම්,

1. පරිසර ගැටලුවලට මුහුණ දුන් ජනතාව විශේෂයෙන් ම ගෝත්‍රිකයින්, ගොවීන්, ධීවරයින් හා කාන්තාවන් තම සාමූහික බලය පෙන්වීම.
2. මහත්මා ගාන්ධිගේ අවිහිංසාවාදය මුල්කොටගෙන සත්‍යග්‍රහ ව්‍යාපාරවල නිරතවීම.
3. ගැටලුවලට අදාළ ප්‍රධාන බලධාරීන් ප්‍රාණ ඇපයේ තබා ගැනීම.
4. මංමාවත් අවහිර වන සේ වීදිවල විරෝධතා පළකිරීම හෝ පෙළපාළි යෑම.
5. සාමූහික නීතිවිරෝධී කටයුතු කිරීම මගින් විශාල පිරිසක් සිරගත වීම.
6. මාරාන්තික උපවාසවල නිරතවීම (දියේ ගිලීමෙන් සියදිවි නසා ගැනීම).

ඉන්දියානු පාරිසරික ව්‍යාපාරයන්හි Chipco සහ Narmada ව්‍යාපාර ඉතා විශාල තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කළේ ය. වන විනාශයට එරෙහි වූ ඇත දුෂ්කර පළාතක කාන්තාවන්ගේ ප්‍රධානත්වයෙන් බිම්මට්ටමින් ඇති වූ සාමූහික ක්‍රියාවක් ලෙස Chipco ව්‍යාපාරය මුළු ලෝකයටම ආදර්ශයක් විය. එමෙන් ම Narmada වේල්ලට එරෙහි වූ ව්‍යාපාරයද ලෝක බැංකුව මුල්කොටගත් දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති අලුත් මාවතකට යොමු කිරීමටත්, ලෝක ප්‍රජාවගේ අවධානය ලබා ගැනීමටත් සමත්විය. Krishnaට (1996) අනුව ඉන්දියාවේ බොහෝමයක් පාරිසරික ව්‍යාපාර දේශපාලනික වශයෙන් වැදගත් සහ තීරණාත්මක විය. එමෙන්ම ඉන්දියානු පාරිසරික ව්‍යාපාරයන්හි කුල හීනයන්ගේ සහ ගෝත්‍රික ප්‍රජාවගේ දායකත්වය ඉතාමත් වැදගත් විය. ඉන්දියානු පරිසර ව්‍යාපාර තුළ තවත් සුවිශේෂ කරුණක් වූයේ ප්‍රබල කුල භේදයක් සහිත ඉන්දියානු සමාජය පරිසර සටන්වල දී කුල භේදයකින් තොරව සාමූහිකව කටයුතු කිරීමයි. Narmada පරිසර ව්‍යාපාරය මෙයට මැනවින් සාක්ෂ්‍ය දරයි.

**පාරිසරික ව්‍යාපාර පිළිබඳ ලාංකේය සමාජයේ අත්දැකීම්.**

ශ්‍රී ලංකාව ස්වාභාවික සම්පත්වලින් පිරි රටක් වන අතර එහි ජීවත්වන ජනතාව පාරම්පරික ලෙස ස්වභාවධර්මය සමඟ ඉතා සමීප සම්බන්ධතාවක් පවත්වාගෙන යයි. එමෙන් ම ලාංකීය ජනයාගේ සංස්කෘතිය ඇදහිලි විශ්වාස හා බොහෝ දෙනාගේ ජීවිකාව ද පරිසර





පද්ධතිය සමඟ ඉතා සමීපව බැඳී පවතී. ශ්‍රී ලංකාව දියුණු වෙමින් පවතින රටක් ලෙස නොයෙක් සංවර්ධන ව්‍යාපෘති දියත් කරමින් තිබේ. මෙම ව්‍යාපෘතිවල පාරිසරික මෙන්ම සමාජ ආර්ථික හා සංස්කෘතික පිරිවැයන් සමාජයෙහි නොයෙක් කතිකා මතවාද හා සාමූහික ක්‍රියා ඇති කරමින් තිබේ. සංවර්ධන ව්‍යාපෘති හෝ සැලසුම් නිසා පරිසර පද්ධතියට එල්ලවන බලපෑම් නිසා ඍජුව හෝ වක්‍රව ජනතාවට එල්ලවන හානිය හේතුකොටගෙන නොයෙක් පරිසර හෝ වෙනත් බිම්මට්ටමේ සාමූහික ක්‍රියා ලාංකේය සමාජයෙහි ඇතිවන පාරිසරික ව්‍යාපාර ලෙස හැඳින්විය හැකිය. එප්පාවල පොස්පේට් නිධිය විදේශ සමාගමකට විකිණීමට යාමේදී කණ්ඩලම හෝටලය ඉදිකිරීමේ දී, නොරොච්චෝලෙයි ගල්අඟුරු හෝ ඉහළ කොත්මලේ ජලවිදුලි බලාගාරය ඉදිකිරීමේ දී හා අධිවේගී මාර්ග ඉදිකිරීමේ දී ඇතිවූ උද්ඝෝෂණ විරෝධතා ව්‍යාපාර හා සාමූහික ජන සංවිධාන හෝ වෙනත් ආකාරයෙන් වූ සමස්ත ලාංකීය පාරිසරික ක්‍රියාකාරකම් පරිසර ව්‍යාපාර ලෙස හඳුන්වා දිය හැකිය (Mahees 2010). මෙවැනි ආකාරයේ කෙටිකාලීන බිම්මට්ටමේ හුදෙකලා වූ සාමූහික පාරිසරික ක්‍රියා පාරිසරික ව්‍යාපාරයක් ලෙස හැඳින්විය නොහැකි යැයි බොහෝ විවේචන ඉදිරිපත් වී ඇත. බටහිර හෝ වෙනත් දියුණු සමාජවල සිදුවන පරිසර ව්‍යාපාර හෝ ඒවාට අදාළ න්‍යාය මගින් ලාංකීය පරිසර ක්‍රියා විශ්ලේෂණය කරන විට ඒවා පාරිසරික ව්‍යාපාර ලෙස සැලකිය නොහැකි වේ. ඒත් ලාංකේය සමාජයෙහි සිදුවන සාමූහික පාරිසරික ක්‍රියා පශ්චාත් නූතනවාදී පර්යාලෝකයෙන් හා තුන්වැනි ලෝකයේ සමාජ දේශපාලන සංදර්භයන් ඇසුරින් බලනවිට මෙම ලාංකේය පාරිසරික ක්‍රියා පරිසර ව්‍යාපාර ලෙස පෙන්වා දිය හැකිය.

Mahees ට (2010) අනුව ශ්‍රී ලංකාවෙහි ඇතිවන සාමූහික පාරිසරික ක්‍රියා යම් අවස්ථාවල කළබලකාරී චර්යා ලෙසත්, තවත් අවස්ථාවල නව සමාජ ව්‍යාපාර ලෙසත් කටයුතු කරයි. තවත් ආකාරයකට සඳහන් කරන්නේ නම් ශ්‍රී ලාංකේය පරිසර ක්‍රියාවන් කලබලකාරී ක්‍රියා මෙන් ම නව සමාජ ව්‍යාපාර ලක්ෂණ යන දෙක ම දැකගත හැකිවේ. උදාහරණයක් ලෙස නොරොච්චෝලේ ජන ව්‍යාපාරයෙහි ධීවරයින්ගේ කලහකාරී ක්‍රියාවන් මෙන් ම ගොවීන් හා රාජ්‍ය නොවන සංවිධාන මගින් දියත් කරන ලද නීත්‍යනුකූල සංවිධානාත්මක වැඩපිළිවෙළක් ද දැකගත හැකිවිය. මේ සඳහා ඔවුන් මාධ්‍ය හා ආගම වැනි සමාජ සංස්ථා යොදා ගත්තේ ය. එමෙන් ම මෙම ලිපියේ පෙර සඳහන් කළ ආකාරයට ලාංකේය පරිසර ක්‍රියා මතවාදාත්මක පරිසරවාදයට වඩා ජීවිකාව මුල්කොටගත් පරිසරවාදයෙන් ඇතිවන්නේ ය. එනම් මෙතෙක් ඇතිවූ බොහෝ

සාමූහික පරිසර ක්‍රියාවන්වල නිතරවූයේ බිම්මට්ටමේ සාමාන්‍ය ජනතාව වන අතර, පරිසරය පිළිබඳ ඔවුන් සතුව ගැඹුරු විද්‍යාත්මක දැනුමක් තිබුනේ නැත. නමුත් ඔවුහු පරිසර පද්ධතිය සමඟ ඉතා සමීප සම්බන්ධතාවක් පවත්වා ගෙන යති. පරිසරයට සිදුවන හානිය නිසා ඔවුන්ගේ ජීවිකාවට එල්ලවන තර්ජනය සැලකිල්ලට ගෙන ඔවුහු පරිසර පද්ධතිය ආරක්‍ෂා කිරීමට පෙලඹුණහ. සමහර විට මෙම ක්‍රියාව මධ්‍යම පාන්තිකයින්ගේ පරිසරය පිළිබඳ අවබෝධය හා විඥානයට වඩා බෙහෙවින් අවංක හා ප්‍රායෝගික එකක් වනු ඇත.

ලාංකේය පරිසර ව්‍යාපාර අවබෝධ කර ගැනීමට අපගේ අවධානය යොමුවිය යුතු තවත් වැදගත් කරුණක් වන්නේ බිම්මට්ටමේ සිදු වූ සාමූහික පාරිසරික ක්‍රියාකාරකම්වල සංවිධාන ව්‍යුහය අධ්‍යයනය කිරීමෙන් පර්යේෂකයා විසින් මීට පෙර සඳහන් කළ ආකාරයට ලාංකේය පරිසර ව්‍යාපාර කලහකාරී චර්යාවන්ගෙන් හා නව සමාජ ව්‍යාපාර යන ලක්‍ෂණ දෙකෙන් ම සැදී තිබූ බැවින් එම තත්ත්වය බිම්මට්ටමේ පාරිසරික ක්‍රියාවල සංවිධාන ව්‍යුහයටද බලපෑම් කළේය.

ලාංකේය සමාජයෙහි ඇති වූ පාරිසරිකවාදය හා පාරිසරික ව්‍යාපාර පිළිබඳ සිදු කෙරුණු පර්යේෂණ සීමා සහිතව පැවතීම නිසා, Mahees (2004) ගේ The Livelihood Vulnerability and Collective Environmental Actions යන ලිපියේ සඳහන් ආකාරයට බිම්මට්ටමේ පාරිසරික ක්‍රියාවන්ගේ ප්‍රධාන සංවිධායකවරුන් බවට පත්වන්නේ විවිධ ජීවිකා මුල්කොටගත් ජන කණ්ඩායම්ය. සොබාදහම හා ජීවිකාව අතර ඇති සමීප බැඳීම් මුල්කොටගෙන ගොවීන් හා ධීවර ජීවිකා කණ්ඩායම් (Livelihood Groups) වැඩි වශයෙන් පාරිසරික ක්‍රියා සංවිධානය කිරීමට පෙළඹිණි. තවත් සමහර අවස්ථාවල සුළු ව්‍යාපාරිකයෝ ද, ගොවීන්, ධීවරයින් සමඟ එක්වී සංවිධාන කටයුතුවල නිරතවූහ. උදාහරණයක් ලෙස, එප්පාවල ව්‍යාපාරය තුළ ගොවීන්ද, නොරොච්චෝලේ ජන අරගලයෙහි ධීවරයෝ ද, අධිවේගී මාර්ගවලට එරෙහි වූ ව්‍යාපාරයෙහි සුළු ව්‍යාපාරිකයෝද, වැඩි වශයෙන් සංවිධාන කටයුතුවලට සම්බන්ධ වූහ. මෙයට අමතරව නිවෙස් හිමියෝ ද තම දේපළවලට වන හානිය සැලකිල්ලට ගෙන අඩු වැඩි වශයෙන් සංවිධාන කටයුතුවල නිරත වූහ. මෙම තත්ත්වය තවදුරටත් ගැඹුරෙන් අවබෝධ කර ගැනීමට පර්යේෂකයා විසින් අධ්‍යයනය කරනු ලැබූ නොරොච්චෝලෙයි ජන අරගලයේදී නොයෙක් ජීවිකා ජන කොටස්වල කාර්යභාරය හා ඔවුන්ගේ සමාජ පරිසර ලක්‍ෂණ මෙසේ ඉදිරිපත් කළ හැකිය.





වගු අංක 01: ජීවිකා ජනකොටස් හා නොරොච්චෝලෙයි ජන ව්‍යාපාරය

| ලක්‍ෂණය | ගොවීන් | ධීවරයින් | සුළු ව්‍යාපාරිකයින් |
|---|---|---|---|
| ආර්ථික පසුබිම | ස්ථාවර | අස්ථාවර | තරමක් ස්ථාවර |
| පරිසරය පිළිබඳ විද්‍යාත්මක දැනුම | ඉහළ මට්ටමක | පහළ මට්ටමක | පහළ මට්ටමක |
| සංවිධාන උපක්‍රම | නීතිය හා මාධ්‍ය මගින් | ප්‍රචණ්ඩකාරී පිළිවෙත | දේශපාලනය |
| මෙහෙයවීම | රාජ්‍ය නොවන සංවිධාන/ආගමික නායකයන් | බිම්මට්ටමේ දේශපාලකයින්/ආගම | ප්‍රජා නායකයින්/ව්‍යාපාර සංවිධාන |
| පෞද්ගලික කැපකිරීම | සැලකිය යුතු මට්ටමක | ඉහළ මට්ටමක | තරමක් දුරට |

ඉහත වගුවෙන් දැක්වෙන්නේ නොරොච්චෝලෙයි පරිසර ව්‍යාපාරයට සහභාගී වූ ප්‍රධාන ජීවිකා කණ්ඩායම් තුනක් වන ගොවීන්, ධීවරයින් සහ සුළු ව්‍යාපාරිකයින්ගේ සමාජ ආර්ථික පසුබිම, පරිසරය පිළිබඳ දැනුම, සංවිධානයවීම සහ කැපවීම පිළිබඳ හරස්කඩකි. ඒ අනුව ලාංකේය සමාජයෙන් පැන නගින පරිසර ව්‍යාපාරවල පුරෝගාමී ප්‍රජා කණ්ඩායම් වන්නේ මෙම ජීවිකා කණ්ඩායම් ය. අනෙක් අතට ගොවීන් පාරිසරික දැනුම අතින් සෙසු ජීවිකා කණ්ඩායම්වලට වඩා ඉදිරියෙන් සිටින අතර ඔවුන්ගේ සංවිධානමය ස්වභාවය ගත්විට ධීවර සහ සුළු ව්‍යාපාරිකයින්ට වඩා තාර්කික භාවයක් පෙන්නුම් කරයි. ඊට හේතුව ඔවුන්ගේ සංවිධාන උපක්‍රම විධිමත් තත්ත්වයක පැවතීමයි. ඊට සාපේක්ෂව ධීවරයින්ගේ ක්‍රියාකාරීත්වය ප්‍රචණ්ඩකාරී ස්වරූපයක් උසුලයි. අනෙක් අතට සුළු ව්‍යාපාරිකයින් ගත්විට ඉහත කී ජීවිකා කණ්ඩායම් දෙකට ම වඩා වෙනස් ය. ඔවුන්ගේ පරිසරය පිළිබඳ දැනුම පහළ මට්ටමක පවතින අතර සංවිධාන ස්වරූපය ද දේශපාලනමය ස්වරූපයෙන් සිදුවීම දැකිය හැකිය.

ලාංකේය පාරිසරිකවාදයේ තවත් තීරණාත්මක සාධකයක් වන්නේ පරිසර ව්‍යාපාරවල නායකත්වයයි. වෙනත් කිසිදු රටක නොවන සේ ලාංකේය පරිසර ව්‍යාපාරවල නායකත්වය පූජ්‍ය පක්‍ෂය විසින් දරනු ලබන්නේය. ලාංකේය සමාජයේ ඇති වූ සියලු ප්‍රධාන පරිසර ක්‍රියාවන්හි නායකත්වය බෞද්ධ භික්ෂූන් මෙන්ම කතෝලික පූජකයින් විසින් දරණු ලැබුවේය. ඉරණවිල, කණ්ඩලම, එප්පාවල හා නොරොච්චෝලේ යන සියලූ ම පරිසර ව්‍යාපාරවල බෞද්ධ හා කතෝලික ආගමික පූජකයින් විසින් නායකත්වය ලබාදීම ලාංකේය පාරිසරික ව්‍යාපාරවලට අයත් සුවිශේෂ ලක්‍ෂණයක් වේ. ඉස්ලාමීය හා හින්දු පූජකයින්ට ඔවුන්ගේ ආගමික සමාජයෙහි සාපේක්‍ෂව අඩු සිවිල් හා තීරණ ගැනීම් බලයක් ඇති

බැවින් ඔවුන්ට කතෝලික හා බෞද්ධ පූජකයින් මෙන් පරිසර ව්‍යාපාරවල ඍජුව ම නිරතවීම නොහැකි වූ නමුත් වක්‍රව තම දායකත්වය ලබාදුන්නේය (Mahees 2010).

සමහර ලාංකේය කතෝලික හා බෞද්ධ පූජකයින් ලාංකේය පාරිසරික ව්‍යාපාරවල පුරෝගාමීන් ලෙස කටයුතු කිරීම නිසා ඔවුහු ලාංකීය පරිසර ව්‍යාපාරවල සංකේත හා වීරයින් (Environmental Icons & Heroes) බවට පත්වූහ. අද වනවිට ලාංකේය පරිසර ව්‍යාපාරයේ සිදුවන ඕනෑ ම පරිසර උද්ඝෝෂණ අරගල විරෝධතාවන් හා දීර්ඝකාලීන ව්‍යාපාරවලට මෙම පූජ්‍ය පක්ෂය සම්බන්ධ කර ගැනීමට සියලු ම පාර්ශ්ව මගින් උත්සාහ දරමින් සිටී. එම නිසා කතෝලික හා බෞද්ධ පූජකයින් කීපදෙනෙක් පාරිසරික ව්‍යාපාර පිළිබඳ විශේෂඥයින් බවට පත්ව ඇති අතර, නිරන්තරයෙන් ඔවුන්ගේ අදහස් හා අනුශාසනා පරිසර ජන ව්‍යාපාරවලට එකතු කර ගනු ලැබේ. ගෝලීය පරිසර ව්‍යාපාරවලට ආදර්ශයක් වන ක්‍රියාමාර්ගයක් ලෙස ලාංකේය පරිසර ව්‍යාපාර තුළ සුවිශේෂ වූ ලෙස ගොඩනැගී ඇති ආගමික නායකයන්ගේ ප්‍රබල කාර්යභාරය පාරිසරික පූජකයින් (Environmental Priests) ලෙස හඳුන්වා දීම යුක්ති යුක්ත ය. මෙම තත්ත්වය තවදුරටත් අවබෝධ කර ගැනීමට Senevirathne ගේ (1992) දායකත්වය බෙහෙවින් උපකාරි වේ. එහිදී කණ්ඩලම පරිසර ව්‍යාපාරයට බෞද්ධ භික්ෂූන්ගේ දායකත්වය ඔහු පැහැදිලි කරයි.

ආගමික පූජකයන්ගේ කාර්යභාරයට අමතරව, ආගම මුල්කොටගත් ආගමික සංවිධාන හෝ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ද නොරොච්චෝල වැනි ලාංකේය පරිසර ව්‍යාපාරයන්හි විශේෂ කාර්යභාරයක් ඉටුකළේය. මේ හේතුවෙන් ම නොරොච්චෝලෙයි ජන ව්‍යාපාරයට නොයෙක් චෝදනා හා විවේචන එල්ලවිය. නොරොච්චෝලෙයි ප්‍රදේශය බහු ජනවාර්ගික ප්‍රදේශයක පිහිටා තිබීම නිසා නොරොච්චොලෙයි ජන ව්‍යාපාරය වඩාත් ශක්තිමත් කිරීමට කතෝලික පූජකවරුන්ගේ ප්‍රධානත්වයෙන් සර්ව ආගමික සංවිධානයක් පිහිටුවා ගනු ලැබුවේ ය.

ලාංකේය පාරිසරික ව්‍යාපාරවල ආගමේ කාර්යභාරය අධ්‍යයනය කරනවිට, හඳුනාගත හැකි තවත් විශේෂ කරුණක් වන්නේ පාරිසරික අභිචාර (Environmental Magics) ශ්‍රී ලංකා සමාජයේ ඇති වූ සියලු ම පාරිසරික අරගලයන් බොහෝ දුරට පවතින රජයට එරෙහිව සිදු වූ ඒවා නිසා පරිසර විරෝධතාවල නිරතවූ අය රජයට හෝ දේශපාලන නායකත්වයට එරෙහිව නඩු හෝ නීත්‍යානුකූලව කටයුතු කිරීමට





නොහැකි වූ විට අවිධිමත් සමාජ බලවේග හෝ චාරිත්‍ර වාරිත්‍ර ඒ සඳහා යොදා ගැනීමයි. එහි දී ඔවුහු පොල් ගැසීම, හූනියම් කිරීම, පුදපූජා පැවැත්වීම යනාදී කාර්යවල නිරත වූහ. පරිසර ගැටලුවලට අදාළ සමහර දේශපාලකයන් හා බලධාරීන් උද්ඝෝෂණ හෝ නීතිමය පියවරවලට වඩා මෙවන් පාරිසරික වශයෙන් සිදුකරන අභිචාරවලට බියවීම විශේෂ සාධකයක් විය. මෙසේ පාරිසරිකවාදය හෝ පාරිසරික ව්‍යාපාරයන්හි අවිධිමත් සමාජ බලවේග හෝ ආගමික නායකත්වයේ කාර්යභාරය ඉස්මතුවීම, පශ්චාත් නූතනවාදී පාරිසරිකවාදය නව මාවතකට යොමු කරමින් සිටින අතර ඒවා පිළිබඳව තව තවත් පර්යේෂණ හා අධ්‍යයන කළයුතුව තිබේ.

යම් සමාජයක ජීවත්වන මිනිසුන්ගේ සංස්කෘතියට ඔවුන්ගේ භෞතික පරිසරය දැඩි බලපෑමක් කරන්නේය. ලාංකේය සමාජයෙහි ද සංස්කෘතිය හා චාරිත්‍ර වාරිත්‍ර පරිසර පද්ධතිය මගින් නිර්ණය කරනු ලබන්නේය (Herath 2009). සමහර විට සංස්කෘතික මෙන්ම ජනවාර්ගික අනන්‍යතාව ද ඔවුන් ජීවත්වන පරිසර පද්ධතියෙන් ඇතිකරනු ලබයි. පරිසර පද්ධතියට සිදුවන හානිය හේතු කොටගෙන යම් ජන කොටසකගේ සංස්කෘතික ක්‍රියාකාරම් කුල ක්‍රමයට හා ජනවාර්ගික අනන්‍යතාවට ද බලපෑම් එල්ල වන්නේ ය. පරිසර පද්ධතිය මුල්කොටගෙන ඇතිවන සංස්කෘතික හා ජන වාර්ගික අනන්‍යතාවට එල්ලවන තර්ජනය හේතු කොටගෙන බිම් මට්ටමේ සමහර ජන කොටස් පාරිසරික ක්‍රියාකාරකම්වල නිරත වන්නේ ය. නොරෙච්චොලේ ප්‍රදේශයේ සමහර කතෝලික ජනතාව හා මුස්ලිම් ව්‍යාපාරිකයින් තම ආගමික හා ජනවාර්ගික අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම පිණිස ගල් අඟුරු බලාගාරයට විරුද්ධ සටනට තම දායකත්වය ලබා දුන්නේ ය. රජයේ සුළු ජන කොටස් ජීවත්වන ප්‍රදේශවල ව්‍යාපාරික වශයෙන් හානි දායක ව්‍යාපෘති ආරම්භ කරමින් සිටිනවායැයි සිතමින් ඔවුහු එම බලාගාරයට එරෙහිව කටයුතු කළහ. ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරයට එරෙහිය ජන ව්‍යාපාරයෙන් ද මෙවැනි ම අදහසක් වතුකරයේ ජීවත්වන ද්‍රවිඩ ජනතාව තුළ දක්නට ලැබුණි. එම නිසා ලාංකේය පාරිසරිකවාදය හෝ ව්‍යාපරවල පාරිසරික ගැටලු ජනවාර්ගීකරණය වීම (Ethnicization of Environmental Problems) දක්නට ලැබිණ. මෙය සැබවින් ම දේශපාලනික වශයෙන් යථාර්ථවාදී නොවුවත් බිම් මට්ටමේ ජවතාව තුළ එවැනි ආකල්පයක් තිබීම සමාජ හෝ මානව විද්‍යාත්මකව ඉතා වැදගත් ය.

මීට අමතරව කැලි කසළ බැහැර කිරීමේ දී ඇති වන අර්බුදවල දී ද හා ඒවා බැහැර කිරීමට තෝරාගන්නා ස්ථාන තෝරා ගැනීමේ දී ද

ලාංකික සමාජයේ නොයෙක් පරිසර උද්ඝෝෂණ විරෝධතාවන් ඇති වී ඇත. මීපේ, දොම්පේ, කොලොන්නාව හා බ්ලූමැන්ඩල් යන ප්‍රදේශවල ඇති වූ සාමූහික පාරිසරික ක්‍රියා මෙයින් ප්‍රධාන වේ. මෙහි දී ඔවුන්ගේ ප්‍රධාන සටන් පාඨය වූවේ "අනුන්ගේ කුණු අපට එපා" යන්නයි. සමහර විට ඔවුන්ගේ මෙම ජන ව්‍යාපාර තුළ සැඟවුණු පන්ති හා දේශපාලන සටන් දක්නට ලැබුණේ ය. ඔවුන් සටන් කර සිටියේ දේශපාලන හෝ සමාජ පන්ති වශයෙන් ප්‍රබල අය ජීවත්වන ප්‍රදේශවල කැලි කසළ දේශපාලන හා පන්ති වශයෙන් දුර්වල ජනතාව ජීවත්වන ප්‍රදේශවලට බැහැර කරන බවයි. එම නිසා ලාංකේය ජන සමාජයේ ඇති වන පාරිසරික ක්‍රියාවන් හෝ ව්‍යාපාර දේශපාලනීකරණය වීමක් දක්නට ලැබේ.

## සමාලෝචනය

පාරිසරිකවාදය හා පාරිසරික ව්‍යාපාර යන සංකල්ප දෙක ම එකිනෙක හොඳින් අනුකලනය වූ එක් දෙයක් වන අතර එකක් අනෙක ප්‍රතිපෝෂණය කරමින් සිටී. මතවාදාත්මකව පාරිසරිකවාදය තුළ දක්නට ලැබෙන දේ ප්‍රායෝගික ක්‍රියාවක් ලෙස පාරිසරික ව්‍යාපාර තුළ දැකගත හැකිය. වර්තමාන ලෝක සමාජ දේශපාලන, ආර්ථික ප්‍රවාහයෙහි පාරිසරික ව්‍යාපාර ඉතාමත් ප්‍රබල වී ඇත. ඒවා අතර තුන්වන ලෝකයේ සිදුවන බිම්මට්ටමේ සාමූහික පරිසර ක්‍රියා තිරසාර සංවර්ධනය නිසි මාර්ගයේ මෙහෙයවන ප්‍රබල බලපෑම් සාධක ලෙස කටයුතු කරමින් සිටී. ලාංකේය සමාජයේ විටින් විට ඇතිවන පාරිසරික ක්‍රියාවන්ට න්‍යායාත්මකව ප්‍රබල විවේචන එල්ල වුව ද ඒවා ගැඹුරු පරිසර විද්‍යාව හා පශ්චාත් නූතන පාරිසරිකවාදයෙන් විශ්ලේෂණය කරන විට ලාංකේය පාරිසරික ක්‍රියා තුන්වන ලෝකයේ තිබෙන සුවිශේෂ පාරිසරිකවාදයක් හෝ පාරිසරික ව්‍යාපාරයක් ලෙස ගෙන දැක්විය හැකිය. ජීවිකා අවදානම් තත්ත්වය, පාරිසරික පූජකයින් හා පාරිසරික ගැටලු ජනවාර්ගීකරණය වීම යන මතවාද මුල්කොටගත් ලාංකේය පාරිසරික ක්‍රියා තුන්වන ලෝකයේ පාරිසරිකවාදයට නව අරුතක් එක්කරමින් සිටී. මෙය තවදුරටත් අවබෝධ කර ගැනීමට නව පර්යේෂණ හා අධ්‍යයන කළ යුතුව තිබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


Agarwal, B.
1997 The Women, Gender and Development, "The Gender and Environment Debate": Lesson from India. London: Zed Books Ltd.







Barrow, C. J.
1995 Developing Environment. London: Scientific Technical.

Beck, U.
1992 Risk Society; Towards a New Modernity. London: Sage.

Darier, E.
1999 Discourse of the Environment. Oxford: Back Well Publication.

Dwivedi, R.
2001 "Environmental Movements in the Global South." International Sociology, 16(1),pp. 11-31.

Faulks, K.
2001 Political Sociology: A Critical Introduction. New York: New York University Press.

Gare, G.A.
1995 Post-modernism and Environmental Crisis. London: Routledge.

Gidden, A.
1989 Sociology. London: Polity Press.

Guha, R, and M. Gadgil
1994 Ecology and Equity: The Use and Abuse of the Nature in Contemporary India. London. New York: Routledge.

Hannigan, J.
2006 Environmental Sociology. London and New York: Routledge.

Herath,H.M.D.R.
2009 'Significance of water in the Sri Lankan context':A Sociological Perspectives: Economic Review (water and livelihood). June / July, A people's Bank Publication.

Krishna, S.
1996 Environmental Politics. New Delhi: Sage Publication.

Mahees, M. T. M.
2010 Environmental Movements in Sri Lanka, Germany: VDM Publisher.

Mahees , M. T. M.
2004 The Livelihood Vulnerability and Collective Environmental Actions in 04th Poverty Symposium Magazine published by Center for Poverty Analysis (SEPA /SPARC).

McCormick, J.
1992 The Global Environmental Movements. New Delhi: CBS Publications.

Mies, M. and V.Shiva
1993 Ecofeminism. New Delhi: Kali for Women.

Pepper, D.
1996 Modern Environmentalism. London , New York: Routledge.

Seneviratna, H.L.
1999 The Work of King, The New Buddhism in Sri Lanka. Chicago: The Chicago University Press.

Shiva, V.
1991 Ecology and the Politics of Survival. New Delhi: Sage publication.

Sirisena, W. M.
2010 Environmental Sociology. Warakapala: Ariya Publishers (in Sinhala).